# ශ්‍රී ලංකා වරාය අධිකාරිය
# දැන්වීමයි

මගේ අංකය: මාසකො/විධා/06/16

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තම තනතුරේ ස්ථිර වූ මෙම අධිකාරියේ සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01 **<u>තනතුර : නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරු (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම) – SLM 2</u>**

**වැටුප් කාණ්ඩය: (SLM 2)**

මූලික වැටුප : රු. 120,040/=

වැටුප් වර්ධකය : රු. 2,155/=

I. **(අ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආරක්ෂක/ මානව සම්පත් කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර අධ්‍යනය/ රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය/ ඒ හා සමාන පශ්චාත් උපාධියක්

**සමඟ**

**පළපුරුද්ද**

SLM 3 වැටුප් කාණ්ඩයේ ආරක්ෂක ක්ෂේත්‍රයේ තනතුරක වසර දෙක (02) ක සක්‍රිය පළපුරුද්ද

**හෝ**

**(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආරක්ෂක/ මානව සම්පත් කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර අධ්‍යනය/ රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය/ ඒ හා සමාන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

**සමඟ**

**පළපුරුද්ද**

SLM 3 වැටුප් කාණ්ඩයේ ආරක්ෂක ක්ෂේත්‍රයේ තනතුරක වසර තුන (03) ක සක්‍රිය පළපුරුද්ද

**හෝ**

**(ඇ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක්

**සහ**

මහපොල වරාය හා සමුද්‍රීය විද්‍යායතනය / සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය / ඒ හා සමාන වෘත්තීය ආයතනයකින් ලබා ගත් ආරක්ෂක ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමා කාලය වසර එක (01) ක් විය යුතුයි)

**සහ**

පිළිගනු ලැබූ වෘත්තීය ආයතනයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමා කාලය වසර එක (01) ක් විය යුතුයි)

**සමඟ**

**පළපුරුද්ද**

SLM 3 වැටුප් කාණ්ඩයේ ආරක්ෂක ක්ෂේත්‍රයේ තනතුරක වසර හතර (04) ක සක්‍රිය පළපුරුද්ද

**හෝ**

**(ඈ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

මහපොල වරාය හා සමුද්‍රීය විද්‍යායතනය / සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය / ඒ හා සමාන වෘත්තීය ආයතනයකින් ලබා ගත් ආරක්ෂක ඩිප්ලෝමාවක්(ඩිප්ලෝමා කාලය වසර එක (01) ක් විය යුතුයි)

**සහ**

02 පිටුවට......

පිළිගනු ලැබූ වෘත්තීය ආයතනයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමා කාලය වසර එක (01) ක් විය යුතුයි)

**සමඟ**

**පළපුරුද්ද**

SLM 3 වැටුප් කාණ්ඩයේ ආරක්ෂක ක්ෂේත්‍රයේ තනතුරක වසර පහක (05) ක සක්‍රීය පළපුරුද්ද සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක සේවයේ වසර විසිපහ (25) ක නොකැඩුල් හා අඛණ්ඩ සේවා කාලයක්

**සටහන :** 1

යහපත් කායික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා ශ්‍රවණ හා දෘෂ්‍ය හැකියාවකින් යුක්ත විය යුතුයි.

**සටහන :** 2

පසුගිය ආසන්න වසර තුන (03) ක කාර්ය සාධනය සතුටුදායක විය යුතුය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියළුම නීති රීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළ යුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි දිවයිනේ ඕනෑම පෙදෙසක හෝ අධිකාරියේ ඕනෑම කොට්ඨාශයක/ අංශයක සේවය කිරීමට බැඳී සිටී.

ආදර්ශ ආකෘතිපත්‍ර ප්‍රකාරව සකසන ලද අයදුම්පත් 2024-07- 18 වෙනි දින හෝ ඊට පෙර ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත ලැබෙන සේ අදාළ කොට්ඨාශ/ අංශ ප්‍රධානියා මගින් එවිය යුතු වේ. ඒ සමඟ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත්ද අමුණා එවිය යුතු අතර, අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් හා මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අයුරින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රමාදවීමට තුඩුදුන් කරුණු අදාළ කොට්ඨාශ ප්‍රධානීන් විසින් සඳහන් කළයුතු අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)**

2024-07- 10 වෙනි දින.

මානව සම්පත් කොට්ඨාශයේදීය.